www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# සුනාමි ආධාර ගිවිසුම ශ්‍රී ලංකාව වඩා ගැඹුරු දේශපාලන අවුලකට තල්ලු කරයි

## Tsunami aid deal plunges Sri Lanka into deeper political turmoil

**සරත් කුමාර විසිනි**
**2005 ජූනි 27**

බොහෝ වැනීම්වලින් පසුව, පසුගිය සිකුරාදා, ශ්‍රී ලංකාවේ ජනාධිපතිනි චන්ද්‍රිකා කුමාරතුංග, සුනාමියෙන් විනාශයට පත් උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල යලි ගොඩනැගීමේ වැඩ සඳහා විදේශ ආධාර ලබා දීමේ ඒකාබද්ධ මන්ඩලයක් පිහිටුවීම පිනිස දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානය සමග ගිවිසුමක් අත්සන් කිරීමට අනුමැතිය දුන්නා ය. විදේශීය ආධාර දෙන රටවල් හා ආයතන ද කොලඹ මහ ව්‍යාපාරිකයන් ද මෙම තීන්දුව සාදරයෙන් පිලිගෙන ඇති නමුදු එය පාලක එක්සත් ජනතා නිදහස් සන්ධානය (එජනිස) ගැඹුරු අර්බුදයකට ඇද දමන බව නිසැක ය.

ආසන 225කින් යුත් පාර්ලිමේන්තුවේ යන්තම් ආසන 79ක බහුතරයක් බවට ආන්ඩුව පත්කරමින්, ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) ජූනි 16 දා එජනිසයෙන් බිඳුනි. ජවිපෙ ජාතික හෙල උරුමය හා සෙසු සිංහල ස්වෝත්තමවාදී කන්ඩායම් සමග එක්ව, ඒකාබද්ධ ආධාර මන්ඩලයට එරෙහිව සිය වර්ගෝත්තමවාදී උද්ඝෝෂනය උත්සන්න කරන බව නිසැක ය. ජවිපෙ ඒකාබද්ධ මන්ඩලය ජාතිය පාවාදීමක් ලෙස හෙලා දැක ඇත.

සිකුරාදා මෙමෙ ගිවිසුම පාර්ලිමේන්තුවේ දී සභාගත කිරීමට ආන්ඩුව ප්‍රයත්න දැරූ කල ජවිපෙ මන්ත්‍රීන් ගෙන ගිය ඝෝෂාකාරී විරෝධතා නිසා පලමුව පාර්ලිමේන්තු රැස්වීම අත්හිටවීමටත් පසුව ජුලි 5 දා දක්වා එය කල් දැමීමටත් කතානායකවරයාට බල කෙරුනි. ජවිපෙ ආධාරකරුවන් 1000ක් පමන “කොටි යාන්ත්‍රනය හංග වේවා” වැනි සටන් පාඨ සහිත පුවරු රැගෙන විරෝධතාවක් පවත්වා කැරලි මර්දන පොලීසිය සමග ගැටුනි. පෙර දින ජවිපෙ නායක සෝමවංශ අමරසිංහ, තම විරෝධතා දැක්වීම්වලට එක් වන ලෙස මහජනතාවට කැඳවුම් කරමින් ම නිවේදනය කලේ සිය පක්ෂය මහා වර්ජනයක් සංවිධානය කරන බවට යි. එල්ටීටීඊය සමග ගිවිසුම ව්‍යවස්ථා විරෝධී යැයි කියාපාමින් නීතිමය පියවර ගැනීමට ද ජවිපෙ සැලසුම් කරයි.

මෙම ස්වෝත්තමවාදී උද්ඝෝෂනය, වාර්ගික දේශපාලනයේ ගිලී පවත්නා කුමාරතුංගගේ ම ශ්‍රී ලංකා නිදහස් පක්ෂය (ශ්‍රීලනිප) ඇතුලු එජනිසයේ ඉතිරි කොටස් තව දුරටත් අස්ථාවර කිරීමට ඉඩ ඇත. එජනිසයේ හවුල්කාර කුඩා පක්ෂ දෙකක -- මහජන එක්සත් පෙරමුන (මඑපෙ) සහ මුස්ලිම් පදනමක් සහිත ජාතික සමගි පෙරමුන (ජාසපෙ) -- නායකයන්, ගිවිසුමේ අන්තර්ගතය සම්බන්ධයෙන් තමන් රැවටීමට ලක් කෙරී ඇතැයි කියාපාමින්, දැනටමත් ආධාර ගිවිසුම විවේචනය කර ඇති අතර ඔවුන් ද ආන්ඩුවෙන් ඉවත් වීමට ඉඩ තිබේ.

ආන්ඩුව, විපාර්ශ්වික පක්ෂවල, විශේෂයෙන් ම සිය දිගු කාලීන දැඩි ප්‍රතිවාදියා වන එක්සත් ජාතික පක්ෂයේ (එජාප), වක්‍ර සහයෝගය මත වාරු වෙමින්, දැන් යන්තම් නූලෙන් එල්ලෙමින් පවතී. ඊයේ සන්ඩේ ටයිම්ස් පත්‍රයේ වාර්තාවන්ට අනුව. එජාපය කුමාරතුංග කල යෝජනා දෙකක් ප්‍රතික්ෂේප කර ඇත. පලමුවැන්න අමාත්‍ය මන්ඩලයේ 50-50 අනුපාතයට ආසන බෙදා ගනිමින් එජනිස ආන්ඩුවට එක්වීම වන අතර දෙවැන්න තමන්ගේ ම ආන්ඩුවක් තැනීම යි.

එජාපය පැහැදිලිව ම සිය විකල්පයන් විවෘතව තබා ගෙන ඇත. එක්සත් ජනපද තානාපතිගේ දිරිගැන්වීම යටතේ, එජාප නායක රනිල් වික්‍රමසිංහ ආධාර ගිවිසුම සඳහා සහයෝගය දෙන බවට කුමාරතුංගට සහතික වී තිබේ. ඒ සමග ම, ආන්ඩුවට එක්වීම මගින් ගිවිසුම පිලිබඳ දේශපාලන වගකීම භාර ගැනීම එජාපය ප්‍රතික්ෂේප කර ඇති අතර, විවිධ කාරනා සම්බන්ධයෙන් ස්වකීය “නොඑකඟතා” ඉදිරිපත් කරයි. ඉහල ආධාර මන්ඩලයේ සිංහල නියෝජනයක් නැතිකම පිලිබඳ ඔවුන් දක්වන විරුද්ධත්වය මතු කෙරී ඇත්තේ ජවිපෙට හා හෙල උරුමයටත් ඔවුන්ගේ වර්ගෝත්තමවාදී උද්ඝෝෂනයටත් දොර විවෘතව තැබීමට යි.

එජාපය නොවැම්බරයේ දී ජනාධිපතිවරනය පැවැත්විය යුතු යැයි ඉල්ලා සිටින අතර සිය ඉල්ලීමට සහයෝගය ගොනු කරනු පිනිස ජුලි 2 දා සිට “ජනබල මෙහෙයුම” නමින් දැවැන්ත උද්ඝෝෂනයක් දියත් කර ඇත.

ජනාධිපතිට පුලුල් විධායක බලතල පවතින බැවින් ජනාධිපතිවරනය පැවැත්විය යුතු කාලය නීතිමය ක්‍රියාමාර්ගවලට ද කුමාරතුංගගේ හා වික්‍රමසිංහගේ දිග්ගැසුනු උපාමාරුවලට ද විෂය වී ඇත. එල්ටීටීඊය සමග සාම සාකච්ඡා මගින් " ජාතික ආරක්ෂාව අනතුරේ හෙලා ඇතැ" යි කියමින් එජාප නායකත්වයෙන් යුත් එකල පාලක සභාගය හිතුවක්කාරි ලෙස බලයෙන් පහ කිරීමට 2004 පෙබරවාරියේ දී කුමාරතුංග මෙම බලතල යොදා ගත්තා ය.

තමන්ට මීට වඩා නියෝජනයක් අවශ්‍ය යැයි ඉල්ලා සිටින මුස්ලිම් පාලක ප්‍රභූවෙන් එල්ල වන විරෝධතාවන්ට ද කුමාරතුංග මුහුන දී සිටී. සිය සංවිධානය ගිවිසුමේ තිල අත්සන්කාර පාර්ශ්වයක් විය යුතු යැයි ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසයේ (ශ්‍රීලමුකො) නායක රවුෆ් හකීම් මෑත දී ඉල්ලා සිටියේ ය. එල්ටීටීඊය විසින් එම යෝජනාව ප්‍රතික්ෂේප කරනු ලැබීමෙන් පසුව, ශ්‍රීලමුකො ගිවිසුම ප්‍රතික්ෂේප කලේ ය. සෙනසුරාද පැවති ප්‍රවෘත්ති සම්මන්ත්‍රනයක දී හකීම් මෙසේ පැවසී යː " ඔවුන් අපට සලකන්නේ පැත්තක සිට බලා සිටින්නන් ලෙස යි. එය පිලිගත නොහැකි යි. අපට එයට සහභාගි වෙන්න බැහැ."

දේශපාලන අර්බුදය පාලනය කර ගැනීමේ මංමුලාසහගත උත්සාහයක් ලෙස, කුමාරතුංග ආධාර ගිවිසුම පිලිබඳ වැඩකටයුතු ඉදිරියට ගෙන ගියේ රහසිගතව ය, එජනිස අමාත්‍ය මන්ඩලයේ සාමාජිකයන්ගෙන් පවා වහංගු කර ගෙන ය. ඒකාබද්ධ යාන්ත්‍රනය ලෙස ද ප්‍රසිද්ධ, පශ්චාත්-සුනාමි මෙහෙයුම් කලමනාකරන ව්‍යුහය ගොඩනැගීම පිලිබඳ ලියවිල්ල, බෙහෙවින් රහසිගතව තබා ගැනුනි. ගිවිසුම පසුදින පාර්ලිමේන්තුවේ දී සභාගත කරන බවට ආන්ඩුව නිවේදනය කලේ බ්‍රහස්පතින්දා සැන්දෑවේ ම ය.

ගිවිසුමේ අර්ථභාරය අඩුතක්සේරු කිරීමේ ප්‍රයත්නයක් ලෙස, එයට අත්සන් කිරීමට ජනාධිපතිවත් අගමැතිවත් සම්බන්ධ වූයේ නැත. ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිලධරයකු වූ පුනරුත්ථාපන අමාත්‍යාංශයේ ලේකම් එම්.එස්. ජයසිංහ ආන්ඩුව වෙනුවෙන් එයට අත්සන් කලේ ය. ඉන් පසුව, මහ බලවතුන් වෙනුවෙන් ගිවිසුම අත්සන් කිරීම සහතික කරගනු පිනිස ශ්‍රී ලංකාවට පැමින සිටි නොර්වේජියානු නියෝජ්‍ය විදේශ ඇමති විඩාර් හෙල්ගසන්, එල්ටීටීඊ පාලන ප්‍රදේශය කරා එම ලියවිල්ල ගෙන ගිය අතර එහි දී එල්ටීටීඊයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු වන ශන්මුගලිංගම් රන්ජන් එයට අත්සන් කලේ ය.

ගිවිසුම අත්සන් කිරීමට පෙරාතුව, කුමාරතුංග, ජ්‍යෙෂ්ඨ භික්ෂූන් මුන ගැසීම පිනිස මහනුවරට හෙලිකොප්ටරයෙන් ගොස්, බෞද්ධ ධූරාවලිය අස්වැසීමට ප්‍රයත්න දැරුවා ය. අස්ගිරිය පාර්ශ්වයේ මහ නායක උඩුගම ශ්‍රී බුද්ධරක්ඛිත ආකාරගතව ගිවිසුම " අනුමත" කලේ ය. එහෙත් අනෙක් ඉහල බෞද්ධ නිකාය වන මල්වත්ත පාර්ශ්වයේ මහ නායක තිබ්බටුවාවේ ශ්‍රී සුමංගල ඒ අවස්ථාවේ මහනුවර නොසිටීම කැපී පෙනුන සිද්ධියක් විය. ඔහු සිය උපන් ගම බලා ගොස් තිබුනි.

හෙල උරුමයේ හා ජවිපෙ උද්ඝෝෂන උදාසීන කිරීමේ ප්‍රයත්නයක් ලෙස ආන්ඩුව ජුනි 17 දා කොලඹ දී බෞද්ධ භික්ෂූන් සිය ගනනක සම්මන්ත්‍රනයක් සංවිධානය කලේ ය. තමන් විරෝධතා දක්වන හෙල උරුමයේ හා ජවිපෙ භික්ෂූන්ට " වඩා බෞද්ධයෙක්" යැයි කුමාරතුංග සම්මන්ත්‍රනය හමුවේ පැවසුවා ය. ඒකාබද්ධ යාන්ත්‍රනය සම්බන්ධයෙන් ශ්‍රීලනිප තුල භේදයන් පවතින බවට දැනටමත් සලකුනු මතුව ඇත. බෞද්ධ ධූරාවලිය සමග සමීප සබඳතා ඇත්තකු ලෙස ප්‍රසිද්ධ අගමැති මහින්ද රාජපක්ෂ, තමන්ට ගිවිසුම ගැන කිසිදු මතභේදයක් නැති බව පැවසූ නමුදු, පශ්චාත්-සුනාමි මෙහෙයුම් කලමනාකරන ව්‍යුහය පිලිබඳ ලියවිල්ල ඉදිරිපත් කල දා ඔහු පාර්ලිමේන්තුවේ නොසිටියේ ය.

කුමාරතුංග ගිවිසුම පිලිබඳ වැඩකටයුතු ඉදිරියට ගෙන විත් ඇත්තේ, එ.ජ. ඩොලර් බිලියන 3ක විදේශ ආධාර ඒකාබද්ධ මන්ඩලය පිහිටුවීම මත රඳා පවතින නිසා ම පමනි. තව දුර ජාත්‍යන්තර මූල්‍ය ආධාර ලැබීම, 2003 අප්‍රේල් මස සිට ඇනහිට පවත්නා එල්ටීටීඊය සමග සාම සාකච්ඡා යලි ඇරඹීම මත රඳා පවතී. එක්සත් ජනපදය හා සෙසු මහ බලවතුන් ඊනියා සාම ක්‍රියාදාමයට පිටුබලය සපයන්නේ, රටේ විසි අවුරුදු සිවිල් යුද්ධය, ආර්ථිකව හා මූලෝපායිකව වඩ වඩා අර්ථභාරයක් අත්පත් කර ගෙන ඇති වඩා පුලුල් ඉන්දියානු උප-මහාද්වීපය අස්ථාවර කිරීමේ තර්ජනය මතු කරන හෙයිනි.

කොලඹ මහ ව්‍යාපාරික කොටස් දිවයිනේ ආර්ථික සෞභාග්‍යය පුනර්ජීවනය කිරීමේ විධික්‍රමයක් ලෙස, සාම සාකච්ඡා යලි ඇරඹීම සඳහා බලකර ඇත. ඒකාබද්ධ ආධාර යාන්ත්‍රනයක් පිහිටුවීමේ තීන්දුවට සහයෝගය දෙන අතර ම, සංගත කව ඒ හා බැඳුනු දේශපාලන අස්ථාවරත්වය පිලිබඳව වඩ වඩා නොසන්සුන් බවට පත්ව තිබේ. කොලඹ කොටස් වෙලඳ පොලේ අලෙවිය පසුගිය සතියේ රුපියල් මිලියන 650 දක්වා සියයට 45.8කින් වැටුනි.

ලංකා වානිජ මන්ඩලයේ සභාපති දේව රුද්‍රිගු සෙනසුරාදා ජාතික රූපවාහිනියෙන් පෙනී සිට පශ්චාත්-සුනාමි මෙහෙයුම් කලමනාකරන ව්‍යුහය පිලිබඳ ගිවිසුම අනුමත කරමින් මෙසේ පැවසී යː " මේ ආකාර වැඩපිලිවෙලක් රටේ යහපතට හේතු වේ. විදේශ ආධාර මගින් රට ආර්ථිකව සංවර්ධනය කල හැකි ය. "

සමස්තයක් ලෙස ඊනියා සාම ක්‍රියාදාමය මෙන් ම, පශ්චාත්-සුනාමි මෙහෙයුම් කලමනාකරන ව්‍යුහය

යටතේ ලැබෙන විදේශ ආධාර ද ලැබෙන්නේ කොන්දේසිවලට යටත්ව ය. පුද්ගලීකරනය, රැකියා කප්පාදුව සහ අයවැය හිඟය කප්පාදු කිරීම ඇතුලු ආර්ථික ප්‍රතිසංස්කරන න්‍යාය පත්‍රයක් ක්‍රියාවට දැමීමට ආන්ඩුවට සිදු වනු ඇතැයි ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සහ ලෝක බැංකුව අවධාරනය කරයි.

එපමනක් නොව, ආධාර යාන්ත්‍රනය, කොලඹ ආන්ඩුව හා එල්ටීටීඊය අතර ඇති වන මොන යම් හෝ අවසන් සාම සම්මුතියක පවත්නා වාර්ගික ස්වභාවය පෙන්නුම් කරයි. එල්ටීටීඊය, ආන්ඩුව සහ මුස්ලිම් පක්ෂ යන එක් එක් පාර්ශ්වයෙන් නියෝජිතයන් සහිත, තෝරා පත් කර නො ගැනෙන කමිටු ධුරාවලියක් -- ඉහල කමිටුවක්, ඊලඟට ප්‍රාදේශීය හා දිස්ත්‍රික් කමිටු වසයෙන් -- පිහිටුවීමට ගිවිසුම මගින් බලය පැවරෙයි. ඉහල කමිටුවට එක් එක් පාර්ශ්වයෙන් එක නියෝජිතයා බැගින් නම් කෙරෙන අතර විදේශ ආධාර දෙන ආයතන නියෝජනය කරන නිරීක්ෂකයකු ද ඇතුලත් වනු ඇත.

සියලු ම පාර්ශ්වයන් අතර පවත්නා අන්‍යොන්‍ය සැකය පිලිබිඹු කරමින්, ඉහල කමිටුවේ තීන්දු ගනු ලබන්නේ ඒකමතික භාවයෙනි. එවන් ඒකමතික භාවයක් නැති වුව හොත්, එවිට එකඟතාවකට පැමිනෙනු පිනිස ස්වකීය පාර්ශ්වයන් වෙත කාරනාව යොමු කිරීමට නියෝජිතයන්ට සිදු වනු ඇත. එම ප්‍රයත්නය අසාර්ථක වුව හොත්, ගිවිසුම අත්හිටවනු ඇත. ප්‍රාදේශීය මට්ටමේ දී, ආන්ඩුවට නියෝජිතයන් දෙදෙනෙක් ද එල්ටීටීඊයට පස් දෙනෙක් ද මුස්ලිම් කන්ඩායම්වලට තිදෙනෙක් ද ආධාර දෙන ආයතනවලට එක් නියෝජිතයෙක් ද සිටිනු ඇත. විදේශ හා දේශීය යන මූලාශ්‍රයන්ගෙන් ලැබෙන ප්‍රාදේශීය අරමුදලේ භාරකාරිත්වය ලෙස බහුපාර්ශ්වීය ඒජන්සියක් නම් කිරීමට නියමිත ය.

එක් එක් පාර්ශ්වය දේශපාලන හා ආර්ථික වාසි වෙනුවෙන් උපාමාරු දමන කල, මෙවන් ව්‍යුහයක්, මොන යම් හෝ ප්‍රජාතන්ත්‍ර නියෝජනයක් බැහැර කිරීම මෙන් ම, තියුනු වාර්ගික ආතතීන් නිර්මානය කරන බවට කිසිදු සැකයක් නැත. කුමාරතුංගගේ ඉල්ලීම්වලට අනුකූලව, ගිවිසුමේ බල ප්‍රදේශය දිස්ත්‍රික්ක හයකට ද ඒවායේත් වෙරලේ සිට කිලෝමීටර් දෙකක් දක්වා වූ ප්‍රදේශයට තදින් ම සීමා කර ඇත. එය වසරක දී අහෝසි වීමට නියමිත ය.

තමන්ගේ පාර්ශ්වයෙන්, එල්ටීටීඊය ගිවිසුම සඳහා බල කරමින් සිටි අතර කුමරතුංගගේ පමාව අවසන් කරන ලෙස මහ බලවතුන්ගෙන් ඉල්ලා සිටියේ ය. ගිවිසුම මගින් එල්ටීටීඊයට යම් මට්ටමක ජාත්‍යන්තර පිලිගැනීමක් ලැබෙන අතර සුනාමියෙන් විපතට පත් ජනතාවගෙන් එල්ල වන විවේචනවලින් ගැලවීමට ආධාර උදව්කාරක වනු ඇත. තමන්ගෙන් බිඳී ගිය කන්ඩායමක සන්නද්ධ ප්‍රතිරෝධයට මුහුන දීමට සිදුව ඇති නැගෙනහිර පලාත තුල සිය තත්වය ඉහල දමා ගැනීමට ගිවිසුමෙන් රුකුලක් ලැබෙනු ඇතැයි ද එල්ටීටීඊය ගනන් බලයි.

කිසිදු පාර්ශ්වයක ගනන් බැලීම්වලට ලක් නො වන කාරනාව නම්, මාස හයක් තිස්සේ දුක්ඛිත තත්වයන් යටතේ දිවි ගෙවමින් සිටින සුනාමියෙන් විපතට පත් දෙමල, සිංහල හෝ මුස්ලිම් ජනයා පිලිබඳ උත්සුකතාව යි.

© www.wsws.org